# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 1 දරන සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත

---

[සහතිකය සටහන් කළේ 1987 ජනවාරි මස 22 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 ජනවාරි මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : රු. 2.40 යි.    තැපැල් ගාස්තුව : රු. 1.15 යි.

## II වන කොටස

## කොමිෂන් සභාවේ කර්තව්‍ය සහ බලතල

කොමිෂන් සභාවේ කර්තව්‍ය.

**5.** කොමිෂන් සභාවේ කර්තව්‍ය පහත සඳහන් පරිදි වන්නේය :—

(අ) 11 වන වගන්තියේ සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශනය කොට උචිත නියමයක් කිරීම ;

(ආ) 18 වන වගන්තිය යටතේ හෝ 19 වන වගන්තිය යටතේ හෝ කොමිෂන් සභාව වෙත කරන ලද යම් ඉල්ලීමක් ගැන විභාග කිරීම සහ උචිත අවස්ථාවල දී ඒ ඉල්ලීමෙහි සඳහන් යම් භාණ්ඩයක් විකිණීමේ දී නොඉක්මවිය යුතු උපරිම කර්මාන්ත ශාලා මිල, තොග මිල හෝ සිල්ලර මිල නියම කිරීම හෝ ඒ මිල නියම කිරීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු මිල ව්‍යුහය දැක්වීම ;

(ඇ) 23 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත කරන ලද යොමු කිරීමක දැක්වෙන යම් කාරණයක් ගැන විභාග කිරීම සහ ඒ යොමු කිරීම කරන අදාළ නියෝජ්‍යායතනය වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවක ස්වරූපයෙන් ඒ කාරණය සම්බන්ධයෙන් උපදෙස් දීම ;

(ඈ) 24 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත කරන ලද යොමු කිරීමක දැක්වෙන යම් කාරණයක් ගැන විභාග කිරීම සහ ඒ යොමු කිරීම කරන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවක ස්වරූපයෙන් ඒ කාරණය සම්බන්ධයෙන් උපදෙස් දීම ; සහ

(ඉ) 25 වන වගන්තිය ප්‍රකාර යම් කාරණයක් පිළිබඳව විභාග කොට වාර්තා කිරීම.

කොමිෂන් සභාව විශේෂ සැලකිල්ල දැක්විය යුතු කාරණා.

**6.** මේ පනතේ 5 වන වගන්තියේ (ආ), (ඇ), (ඈ) සහ (ඉ) ඡේද යටතේ කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේදී කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ල දැක්විය යුතු ය :—

(අ) භාණ්ඩ පාරිභෝගිකයන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම ;

(ආ) භාණ්ඩ නිෂ්පාදකයන්ට අවශ්‍ය අනුබල ලබා දීම ;

(ඇ) භාණ්ඩ නිෂ්පාදනය කිරීමෙහිලා හෝ සේවාවන් සැලසීමෙහිලා ආයෝජනය කරනු ලැබූ ප්‍රාග්ධනය මත සාධාරණ ලාභ අනුප්‍රමාණ ලැබීම සහතික කිරීමේ අවශ්‍යතාව ;

(ඈ) රටේ ආර්ථිකයේ විවිධ අංශවලට සම්පත් වෙන් කරදීම ;

(ඉ) භාණ්ඩ නිෂ්පාදනය කිරීමෙහි හෝ සේවාවන් සැලසීමෙහි නිරත වූ හෝ භාණ්ඩ නිෂ්පාදනයට හෝ සේවා සැලසීමට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික යම් ක්‍රියාකාරකමක නිරත වූ රාජ්‍ය සංස්ථාවල කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය ;

(ඊ) උද්ධමනය පාලනය කිරීම ;

(ඉ) ආණ්ඩුවේ ආර්ථික සහ සමාජ ප්‍රතිපත්තියේ වෙනත් පරමාර්ථ ; සහ

(ඊ) අමාත්‍යවරයා විසින් කලින් කල දෙනු ලබන යම් ගුරු උපදේශ.

වාර්තා පවත්වා ගෙන යන ලෙස සහ වාර වාර්තා සපයන ලෙස නියම කිරීමට ඇති බලය.

7. කොමිෂන් සභාව විසින්, ස්වකීය බලතල නිසිලෙස ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය ඉටු කිරීම සඳහා යම් භාණ්ඩයක නිෂ්පාදකයන්ට, ආනයනකරුවන්ට සහ බෙදාහරින්නන්ට සහ යම් නියමිත සේවාවක් සැලසීමෙහි නිරත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ රාජ්‍ය සංස්ථාවකට —

(අ) අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් කාරණා සම්බන්ධයෙන් සහ කොමිෂන් සභාව විසින් නිර්ණය කරනු ලබන යම් ආකෘති අනුව වාර්තා පවත්වා ගෙන යාමට, සහ

(ආ) අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන කාරණා සම්බන්ධයෙන් සහ කොමිෂන් සභාව විසින් නිර්ණය කරනු ලබන කාලසීමා සහ ආකෘති අනුව වාර වාර්තා කොමිෂන් සභාව වෙත සැපයීමට

නියම කරනු ලැබිය හැකිය.

තොරතුරු සපයන ලෙස ඉල්ලීමට කොමිෂන් සභාව සතු බලය.

8. (1) කොමිෂන් සභාව විසින් හෝ තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් ලිඛිත දැන්වීමක් මගින් යම් තැනැත්තකුට කොමිෂන් සභාවේ බලතල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන, ඒ දැන්වීමෙහි සඳහන් තොරතුරක් හෝ ලේඛනයක් එහි සඳහන් කාලසීමාව ඇතුළත සපයන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි අතර, ඒ තොරතුර අනාවරණය කිරීම හෝ ඒ ලේඛනය ඉදිරිපත් කිරීම ඒ දැන්වීම ලබන යම් තැනැත්තකුට තහනම් කැරෙන යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද ඒ දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත ඒ නියමය අනුව කටයුතු කිරීම ඒ දැන්වීම ලබන තැනැත්තාගේ කාර්යය වන්නේ ය :

එසේ වුව ද ඒ තැනැත්තා විසින් යම් තොරතුරක් අනාවරණය කිරීම හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම, විනිමය පාලන පනතේ හෝ යම් බද්දක් පැනවීම සහ අයකර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වෙන යම් නීතියක යම් විධිවිධානයකින් තහනම් කර ඇති නම්, ඒ තොරතුර සපයන ලෙස හෝ ඒ ලේඛනය ඉදිරිපත් කරන ලෙස ඒ තැනැත්තාට කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් දැන්වීමක් මගින් නියම කිරීමට මේ උපවගන්තියේ සඳහන් කිසිවකින් බලය දෙනැයි තේරුම් ගැනීම හෝ අර්ථ දැක්වීම නොකළ යුත්තේ ය.

(2) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අනාවරණය කරන ලෙස නියම කරනු ලැබිය හැකි යම් තොරතුරක් හෝ ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි යම් ලේඛනයක් ඒ තැනැත්තා විසින් අනාවරණය කිරීම හෝ ඉදිරිපත් කිරීම යම් ලිඛිත නීතියක විධිවිධාන මගින් තහනම් කර ඇති අවස්ථාවක, එවැනි යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, ඒ තැනැත්තා විසින් කරන ලද ඒ අනාවරණය කිරීම හෝ ඉදිරිපත් කිරීම ඒ ලිඛිත නීතිය කඩ කිරීමක් ලෙස නොසැලකිය යුතු ය.

(3) 7 වන වගන්තිය යටතේ සපයන ලද වාර වාර්තාවක ඇතුළත් කිසිම තොරතුරක් හා මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් ප්‍රකාර කටයුතු කිරීමෙහිලා සපයන ලද කිසිම තොරතුරක් හෝ ඉදිරිපත් කරන ලද ලේඛනයක ඇතුළත් කරුණු අවස්ථාවෝචිත පරිදි, ඒ වාර වාර්තාව හෝ තොරතුර සපයන හෝ ඒ ලේඛනය ඉදිරිපත් කරන තැනැත්තාගේ කැමැත්ත ඇතිව මිස, නැතහොත් කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරීමේ දී මිස, කොමිෂන් සභාව විසින් පළ කිරීම හෝ වෙනත් යම් තැනැත්තකුට දැන්වීම හෝ නොකළ යුතු ය.

යම් ස්ථානයකට ඇතුළුවීමට සහ එය පරීක්ෂා කිරීමට යම් නිලධරයකුට බලය දීමට කොමිෂන් සභාවේ බලය.

9. 11 වන වගන්තිය යටතේ විමර්ශනයක් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන අවස්ථාවක, යම් ව්‍යාපාරයක් කරගෙන යන යම් ස්ථානයකට දිවා කාලයේ සියලු සාධාරණ වේලාවන්හි දී ඇතුළුවීමට සහ එය පරීක්ෂා කිරීමට ද ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් මේ පනත හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ යටතේ තබා ගැනීමට නියමිත යම් වාර්තා පරීක්ෂා කිරීමට සහ ඒවායේ පිටපත් ගැනීමට ද යම් නිලධරයකුට කොමිෂන් සභාව විසින් ලිඛිත ව බලය දෙනු ලැබිය හැකි ය.

පරීක්ෂණ සහ විමර්ශන පැවැත්වීමේ බලතල.

10. (1) කොමිෂන් සභාව විසින්—

(අ) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා අවශ්‍ය වූ හෝ අවස්ථානුකූල වූ විටෙක යම් පරීක්ෂණ පැවැත්වීම ; සහ

(ආ) 11 වන වගන්තිය යටතේ විමර්ශන පැවැත්වීම

කරනු ලැබිය හැකි ය.

(2) පාරිභෝගික සංගම්වල හෝ සංවිධානවල නියෝජිතයන් ඇතුළු මේ වගන්තිය යටතේ පවත්වනු ලබන අවස්ථාවෝචිත පරිදි, පරීක්ෂණයකට හෝ විමර්ශනයකට විෂය වන්නා වූ යම් කාරණයක් පිළිබඳව සම්බන්ධතාවක් ඇති සියලු තැනැත්තන්ට, ඒ පිළිබඳව කරුණු කියා පෑමටත්, කොමිෂන් සභාවේ මතය අනුව ඒ කාරණයට අදාළ වාචික හෝ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමටත් කොමිෂන් සභාව විසින් අවස්ථාවක් දෙනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන, අවශ්‍යාවෝචිත පරිදි යම් පරීක්ෂණයක හෝ විමර්ශනයක කාර්ය සඳහා, කොමිෂන් සභාවට පහත සඳහන් කරුණු පිළිබඳව දිසා අධිකරණයකට ඇති සියලුම බලතල ඇත්තේ ය :—

(අ) යම් සාක්ෂිකරුවකු කැඳවීම සහ පැමිණ සිටින ලෙස බල කිරීම ;

(ආ) ලේඛන ඉදිරිපත් කරන ලෙස බල කිරීම ; සහ

(ඇ) යම් සාක්ෂිකරුවකු ලවා දිවුරවීම හෝ ප්‍රතිඥා කරවීම.

(4) යම් තැනැත්තකු විසින්—

(අ) ඒ කොමිෂන් සභාව විසින්, අවශ්‍යාවෝචිත පරිදි, යම් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පවත්වන අතරතුර හෝ පවත්වා අවසාන වීමෙන් පසුව සෑහෙන හේතුවක් නොමැතිව කොමිෂන් සභාව හෝ එහි යම් සාමාජිකයකු අපකීර්තියට පත කරන යම් ප්‍රකාශයක් පළ කරන ලද හෝ යම් දෙයක් කරන ලද අවස්ථාවක ; හෝ

(ආ) කොමිෂන් සභාවේ නීත්‍යානුකූල ක්‍රියාවලියට බාධා පමුණුවන ලද අවස්ථාවක ; හෝ

(ඇ) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අවශ්‍යාවෝචිත පරිදි, යම් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පවත්වන අතරතුර දී—

(i) කොමිෂන් සභාව විසින් ඒ තැනැත්තාට නිකුත් කරන ලද යම් සිතාසියක දැක්වෙන වේලාවේ දී සහ ස්ථානයේ දී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව, පැහැර හරින ලද අවස්ථාවක ; හෝ

(ii) දිවීරීම ප්‍රතික්ෂේප කරන ලද හෝ යථා පරිදි දිවුරවනු ලැබ, කොමිෂන් සභාව විසින්, අවශ්‍යාවෝචිත පරිදි, පරීක්ෂා කරනු ලබන හෝ විමර්ශනය කරනු ලබන යම් කාරණා සම්බන්ධයෙන් ඔහුගෙන් අසන ලද යම් ප්‍රශ්නවලට පිළිතුරු දීම, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව, ප්‍රතික්ෂේප කරන ලද හෝ පැහැර හරින ලද අවස්ථාවක ; හෝ

(iii) තම සන්තකයෙහි හෝ බලය යටතේ තිබෙන්නා වූ ද, කොමිෂන් සභාව විසින්, අවශ්‍යාවෝචිත පරිදි, පරීක්ෂා කරනු ලබන හෝ විමර්ශනය කරනු ලබන කාරණාවලට කොමිෂන් සභාවේ මතය අනුව අදාළ වන්නා වූ ද යම් ලේඛනයක් කොමිෂන් සභාව

වෙත ඉදිරිපත් කර පෙන්වීම, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන ලද හෝ පැහැර හරින ලද අවස්ථාවක

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව කෙරෙන පරිදි හෝ අපහාස කිරීමේ වරදකට වරදකරු වන්නේ ය.

(5) යම් තැනැත්තකු කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි හෝ අපහාස කිරීමේ වරද කර ඇතැයි කොමිෂන් සභාව විසින් නිරණය කරන ලද අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ස්වකීය මහා ලේකම් ලවා කොමිෂන් සභාවේ නිරණය දක්වන සහතිකයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය හැකි ය. එවැනි සෑම සහතිකයක්ම කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අත්සන් කළ යුතු ය.

(6) (8) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි සංජානනය කිරීම සඳහා යයි අභියාචනාධිකරණය කල්පනා කරන අපහාස වරදක් පිළිබඳව දඬුවම් පැමිණවීම සඳහා පවත්වනු ලබන යම් නඩු කටයුත්තක දී, (5) වන උපවගන්තිය යටතේ, අත්සන් කරනු ලැබ අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සහතික යක් ලෙස සැලකෙන යම් ලේඛනයක් එහි දක්වා ඇති නිරණයෙහි සඳහන් කරුණු පිළිබඳ සාක්ෂි විය යුතු අතර, ඒ නිරණය කොමිෂන් සභාව විසින් කරන ලද බවට නිරණාත්මක සාක්ෂිය විය යුතු ය.

(7) කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි හෝ කරන ලද යි කියන යම් අපහාස වරදකට දඬුවම් පැමිණවීම සඳහා (8) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි පවත්වනු ලබන යම් නඩු කටයුත්තක දී කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයකු, ඔහුගේ කැමැත්ත ඇතිව මිස සාක්ෂිකරුවකු ලෙස කැඳවීම හා ඔහුගෙන් ප්‍රශ්න කිරීම නොකළ යුතු ය.

(8) කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි හෝ කරන ලද සෑම අපහාස වරදක් පිළිබඳව අභියාච නාධිකරණය විසින් දඬුවම් කරනු ලැබිය හැකි විය යුතු ය.

## III වන කොටස

## කොමිෂන් සභාව විසින් කෙරෙන විමර්ශන

කොමිෂන් සභාව විසින් විමර්ශන පැවැත්විය යුතු බව.

**11.** කොමිෂන් සභාව විසින්, සිය මෙහෙයීමෙන්ම හෝ යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලක් මත හෝ යෝජිත ඒකාබද්ධ කිරීමක් සම්බන්ධයෙන් වන විට, යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාවෙන් කරන ලද ඉල්ලීමක් මත පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් විමර්ශන යක් කළ හැකි ය:—

(අ) ඒකාධිකාර තත්ත්වයක් පැවතීම හෝ ඒකාධිකාර තත්ත්වයක් පැවතීමට ඉඩ තිබීම;

(ආ) ඒකාබද්ධ කිරීමේ තත්ත්වයක් ඇති කිරීම හෝ ඇති කිරීමට ඉඩ තිබීම ;

(ඇ) යම් තරඟ විරෝධී චර්යාවක් ප්‍රචලිතව පැවතීම.

12. 11 වන වගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා ඒකාධිකාර තත්ත්වයක් පහත දක්වෙන ආකාරයෙන් පවත්නා ලෙස සලකනු ලැබිය යුතු ය :— ඒකාධිකාර තත්ත්වය.

(1) යම් විස්තරයක බඩු සැපයීම සම්බන්ධයෙන් වූ විට පහත සඳහන් අවස්ථාවලදී, එනම්—

(අ) ශ්‍රී ලංකාව තුළ සපයනු ලබන ඒ විස්තරයට අයත් බඩු සියල්ලෙන් නියමිත ප්‍රතිශතය එකම තැනැත්තකු විසින් හෝ එකම තැනැත්තකුට හෝ සපයනු ලබන අවස්ථාවක ; හෝ

(ආ) ශ්‍රී ලංකාව තුළ සපයනු ලබන ඒ විස්තරයට අයත් බඩු සියල්ලෙන් නියමිත ප්‍රතිශතය එකම අන්තර්බද්ධ සංස්ථා සමූහයක සාමාජිකයන් විසින් හෝ එකම අන්තර්බද්ධ සංස්ථා සමූහයක සාමාජිකයන්ට හෝ සපයනු ලබන අවස්ථාවක ; හෝ

(ඇ) ශ්‍රී ලංකාව තුළ සපයනු ලබන ඒ විස්තරයට අයත් බඩු සියල්ලෙන් නියමිත ප්‍රතිශතය යම් තැනැත්තන් දෙදෙනෙකුගෙන් හෝ වැඩි දෙනෙකුගෙන් සමන්විත එකම සමූහයක සාමාජිකයන් විසින් හෝ යම් තැනැත්තන් දෙදෙනෙකුගෙන් හෝ වැඩි දෙනෙකුගෙන් සමන්විත එකම සමූහයක සාමාජිකයන්ට හෝ සපයනු ලබන අවස්ථාවක : යම් විස්තරයකට අයත් බඩු සම්බන්ධයෙන් මේ ඡේදයෙහි සඳහන් "තැනැත්තන් දෙදෙනකු හෝ වැඩිදෙනකු" යන්නෙන් තරඟය නිසා තමන්ටම බල පෑමක් ඇති වුව ද නැත ද, තරඟය ඇත්තේ නිෂ්පාදකයන් හෝ සපයන්නන් වශයෙන් සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් අතරේ වුව ද නිෂ්පාදකයන්ගේ හෝ සපයන්නන්ගේ අනුග්‍රාහකයන් වශයෙන් සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් අතරේ වුව ද, එම විස්තරයට අයත් බඩු නිෂ්පාදනය හෝ සැපයීම සම්බන්ධයෙන් වූ තරඟය යම් ආකාරයකින් වැළැක්වෙන, සීමා කෙරෙන හෝ විකෘත කෙරෙන ලෙස ස්වේච්ඡාවෙන් හෝ එසේ නොමැතිව හෝ, එකඟවීමක් ඇතිව හෝ නැතිව හෝ ස්වකීය කටයුතු කරගෙන යන (අන්තර්බද්ධ සංස්ථා සමූහයක් නොවන) තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි දෙනකු අදහස් කෙරේ ; හෝ

(ඈ) එම විස්තරයට අයත් බඩු ශ්‍රී ලංකාව තුළ නොසැපයීමේ ප්‍රතිඵලය හෝ සාමූහික ප්‍රතිඵලය ගෙන දෙන එකඟවීම් එකක් හෝ වැඩි ගණනක් ක්‍රියාත්මකව ඇති අවස්ථා වක.

(2) යම් විස්තරයකට අයත් සේවා සැපයීම සම්බන්ධයෙන් වූ විට, පහත සඳහන් අවස්ථාවල දී, එනම්:—

(අ) ශ්‍රී ලංකාව තුළ සපයනු ලබන එම විස්තරයට අයත් සේවා වන්ගෙන් නියමිත ප්‍රතිශතයේ ප්‍රමාණය එකම තැනැත්තකු විසින් හෝ එකම තැනැත්තකුට හෝ සපයනු ලබන අවස්ථාවක; හෝ

(ආ) ශ්‍රී ලංකාව තුළ සපයනු ලබන එම විස්තරයට අයත් සේවා වන්ගෙන් නියමිත ප්‍රතිශතයේ ප්‍රමාණය එකම අන්තර්බද්ධ සංස්ථා සමූහයක සාමාජිකයන් විසින් හෝ එකම අන්තර්බද්ධ සංස්ථා සමූහයක සාමාජිකයන්ට හෝ සපයනු ලබන අවස්ථාවක; හෝ

(ඇ) ශ්‍රී ලංකාව තුළ සපයනු ලබන එම විස්තරයට අයත් සේවා වන්ගෙන් නියමිත ප්‍රතිශතයේ ප්‍රමාණය යම් තැනැත්තන් දෙදෙනකුගෙන් හෝ වැඩි දෙනකුගෙන් සමන්විත එකම සමූහයක සාමාජිකයන් විසින් හෝ යම් තැනැත්තන් දෙදෙනෙකුගෙන් හෝ වැඩි දෙනෙකුගෙන් සමන්විත එකම සමූහයක සාමාජිකයන්ට හෝ සපයනු ලබන අවස්ථාවක; යම් විස්තරයකට අයත් සේවා සම්බන්ධයෙන් මේ වගන්තියේ මේ ඡේදයෙහි සඳහන් "තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි දෙනකු" යන්නෙන් තරගය නිසා තමන්ටම බලපාමක් ඇති වුව ද නැත ද, තරගය එම සේවාවන් සපයන්නන් වශයෙන් සම්බන්ධතාවක් දක්වන්නන් අතර වුව ද සපයනු ලබන්නන් වශයෙන් සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් අතර වුව ද එම විස්තරයට අයත් සේවාවන් සැපයීම සම්බන්ධයෙන් වූ තරගය යම් ආකාරයකින් වැළැක්වෙන, සීමා කෙරෙන හෝ විකෘත කෙරෙන ලෙස, ස්වේච්ඡාවෙන් හෝ එසේ නොමැතිව හෝ එකඟවීමක් ඇතිව හෝ නැතිව හෝ, ස්වකීය කටයුතු කරගෙන යන (අන්තර්බද්ධ සංස්ථා සමූහයක් නොවන) යම් තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි දෙනකු අදහස් වේ; හෝ

(ඈ) එම විස්තරයට අයත් සේවාවන් ශ්‍රී ලංකාව තුළ නොසැපයීමේ ප්‍රතිඵලය හෝ සාමාන්‍ය ප්‍රතිඵලය ගෙන දෙන එකඟවීම් එකක් හෝ වැඩි ගණනක් ක්‍රියාත්මකව ඇති අවස්ථාවක.

(3) යම් විස්තරයකට අයත් බඩු ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම සම්බන්ධයෙන්වූ විට, පහත සඳහන් අවස්ථාවල දී, එනම්:—

(අ) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන එම විස්තරයට අයත් බඩු සියල්ලෙන් නියමිත ප්‍රතිශතය එකම තැනැත්තකු විසින් නිෂ්පාදනය කරනු ලබන අවස්ථාවක; හෝ

(ආ) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන එම විස්තරයට අයත් බඩු සියල්ලෙන් නියමිත ප්‍රතිශතය එකම අන්තර්බද්ධ සංස්ථා සමූහයක සාමාජිකයන් විසින් නිෂ්පාදනය කරනු ලබන අවස්ථාවක;

තවද ඒ අවස්ථාවල දී ශ්‍රී ලංකාවෙන් එම විස්තරයට අයත් බඩු සාමාන්‍යයෙන් අපනයනය කිරීම සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකාවෙන් එම විස්තරයට අයත් බඩු වෙන් වෙන්ව ගත් එක් එක් වෙළෙඳ පළට අපනයනය කිරීම සම්බන්ධයෙන් ද ඒකාධිකාර තත්ත්වයක් පවතින ලෙස මේ වගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකාවෙන් යම් විස්තරයකට අයත් බඩු සාමාන්‍යයෙන් අපනයනය කිරීම සම්බන්ධයෙන් වූ විට—

(අ) එම විස්තරයට අයත් බඩු ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම යම් ආකාරයකින් වළක්වන හෝ සීමා කරන නැතහොත් ඒ සම්බන්ධයෙන් වූ තරගය යම් ආකාරයකින් වළක්වන, සීමා කරන හෝ විකෘති කරන එකඟවීම් එකක් හෝ වැඩි ගණනක් ක්‍රියාත්මක ව ඇති අවස්ථාවක ; සහ

(ආ) (අ) ඡේදයෙහි සඳහන්, එම එකඟවීම, හෝ අවස්ථාවෝචිත පරිදි, එම එකඟවීම් සාමූහිකව ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන එම විස්තරයට අයත් බඩු සියල්ලේ නියමිත ප්‍රතිශතය සම්බන්ධයෙන් ක්‍රියාත්මක ව ඇති අවස්ථාවක.

(5) යම් විස්තරයකට අයත් බඩු ශ්‍රී ලංකාවෙන් යම් විශේෂිත වෙළෙඳ පළකට අපනයනය කිරීම සම්බන්ධයෙන් වූ විට—

(අ) එම විස්තරයට අයත් බඩු (ශ්‍රී ලංකාවෙන් වුව ද නොවුව ද) එම වෙළෙඳ පළට සැපයීම යම් ආකාරයකින් වළක්වන හෝ සීමාකරන නැතහොත් ඒ සම්බන්ධයෙන් වූ තරගය යම් ආකාරයකින් වළක්වන, සීමා කරන හෝ විකෘති කරන එකඟවීම් එකක් හෝ වැඩි ගණනක් ක්‍රියාත්මකව ඇති අවස්ථාවක ; සහ

(ආ) (අ) ඡේදයෙහි සඳහන් එම එකඟවීම, හෝ අවස්ථාවෝචිත පරිදි එම එකඟවීම් සාමූහිකව, ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන එම විස්තරයට අයත් බඩු සියල්ලේ නියමිත ප්‍රතිශතය සම්බන්ධයෙන් ක්‍රියාත්මකව ඇති අවස්ථාවක.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා "නියමිත ප්‍රතිශතය" යන්නෙන්—

(අ) යම් විස්තරයකට අයත් බඩු සැපයීම ;

(ආ) යම් විස්තරයකට අයත් සේවාවන් සැපයීම ; සහ

(ඇ) යම් විස්තරයකට අයත් බඩු අපනයනය කිරීම

සම්බන්ධයෙන් වන විට කොමිෂන් සභාවේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින්, නියෝග මගින් නියම කරනු ලබන ප්‍රතිශතය අදහස් වන අතර ඒ ප්‍රතිශතය, යම් විස්තරයකට අයත් බඩු හෝ සේවාවන් සැපයීමෙන් හෝ යම් විස්තරයකට අයත් බඩු අපනයනයෙන් හෝ තුනෙන් එකකට අඩු නොවිය යුතුය.

(7) (6) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාට ස්වකීය නිර්දේශ කිරීමේ දී, කොමිෂන් සභාව විසින්, යම් තැනැත්තකු හෝ එකම අන්තර්බද්ධ සංස්ථා සමූහයක සාමාජිකයන් විසින් හෝ වෙළෙඳ පලේ උසුලන කොටස පරීක්ෂා කළ යුතු අතර, වෙළෙඳ පලෙහි ඒ කොටස ඉසිලීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන වෙළෙඳ පළ බලය—

(අ) වෙළෙඳ පලෙහි තරඟකරුවකු ඉවත් කිරීමේ හෝ ඔහුට බල වත් ලෙස හානි කිරීමේ;

(ආ) වෙළෙඳ පළට තරඟකරුවකු ඇතුළුවීම වැළැක්වීමේ; සහ

(ඇ) වෙළෙඳ පලෙහි තරඟකාරී කටයුතුවල නිරතවීමෙහිලා තැනැත්තකු අධෛර්ය කිරීමේ හෝ වැළැක්වීමේ

කාර්ය සඳහා උපයෝගී කරගනු ලැබිය හැකිදැයි තීරණය කළ යුතු ය.

ඒකාබද්ධ කිරීමේ තත්ත්වය.

13. (1) සංස්ථාවක් වුව ද නොවුව ද යම් තැනැත්තකු සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රාග්ධනයේ හෝ වත්කම් වල යම් කොටස් කෙළින්ම හෝ අන් ආකාරයකින් අත්කර ගන්නා වූ හෝ අත්කර ගැනීමට යෝජනා කරන්නාවූ පහත සඳහන් යම් අවස්ථාවක ඒකාබද්ධ කිරීමේ තත්ත්වයක් පවතින ලෙස 11 වන වගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය :—

(අ) ඒ අත්කරගැනීමේ හෝ යෝජිත අත්කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් බඩු හෝ සේවාවන් සඳහා වූ වෙළෙඳ පලක් පාලනය කළ හැකි හෝ යටත් කරගත හැකි තත්ත්වයකට ඒ පළමු සඳහන් තැනැත්තා පත්වන හෝ පත්වීමට ඉඩ ඇති අවස්ථාවක ; හෝ

(ආ) බඩු හෝ සේවාවන් සඳහා වූ වෙළෙඳ පළ පාලනය කළ හැකි හෝ යටත් කර ගත හැකි තත්ත්වයක ඒ පළමු සඳහන් තැනැත්තා සිටිය දී—

(i) වෙනත් යම් තැනැත්තකු හෝ සංස්ථාවක් හෝ වෙනත් යම් සම්බන්ධිත තැනැත්තකු හෝ සංස්ථාවක් හෝ ඒ පළමු සඳහන් තැනැත්තාගේ හෝ ඒ පළමු සඳහන් තැනැත්තාට සම්බන්ධිත සංස්ථාවක තරඟකරුවකු වන්නා වූ හෝ වීමට ඉඩ ඇති ; සහ

(ii) අත්කරගැනීම හෝ යෝජිත අත්කරගැනීම නිසා ඒ වෙළෙඳ පළ පාලනය කිරීමට හෝ යටත් කර ගැනීමට ඒ පළමු සඳහන් තැනැත්තාට ඇති බලය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වන හෝ වැඩි වීමට ඉඩ ඇති

අවස්ථාවක.

(2) පහත සඳහන් අවස්ථාවල දී ඒ පළමු සඳහන් තැනැත්තා වෙළෙඳ පළක් පාලනය කළ හැකි හෝ යටත් කරගත හැකි තත්ත්වයක සිටින ලෙස මේ වගන්තියේ කාර්ය සඳහා සැලකිය යුතු ය :—

(අ) ඒ පළමු සඳහන් තැනැත්තාට සම්බන්ධිත සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් හෝ ඒ පළමු සඳහන් තැනැත්තාට සම්බන්ධිත එවැනි එක් එක් පුද්ගල මණ්ඩල දෙකක් හෝ වැඩි ගණනක් එක්ව, බඩු හෝ සේවාවන් සඳහා වූ වෙළෙඳ පළක් පාලනය කළ හැකි හෝ යටත් කරගත හැකි තත්ත්වයක සිටින අවස්ථාවක ; හෝ

(ආ) ඒ පළමු සඳහන් තැනැත්තා සහ ඒ පළමු සඳහන් තැනැත්තාට සම්බන්ධිත සංස්ථාවක් හෝ ඒ පළමු සඳහන් තැනැත්තා සහ එසේ සම්බන්ධිත එක් එක් සංස්ථාවලින් දෙකක් හෝ වැඩි ගණනක් එක්ව, බඩු හෝ සේවාවන් සඳහා වූ වෙළෙඳ පළක් පාලනය කළ හැකි හෝ යටත් කරගත හැකි තත්ත්වයක සිටින අවස්ථාවක.

(3) මේ වගන්තියෙහි—

(අ) "බඩු හෝ සේවාවන් සඳහා වූ වෙළෙඳ පළක්" ගැන වූ සඳහන් කිරීමක් ශ්‍රී ලංකාව තුළ බඩු හෝ සේවාවන් සඳහා වූ සැලකිය යුතු ප්‍රමාණයක වෙළෙඳ පළක් පිළිබඳ සඳහන් කිරීමක් ලෙස තේරුම් ගත යුතු ය ; හා

(ආ) "බඩු හෝ සේවාවන් සඳහා වූ වෙළෙඳ පළක් පාලනය කිරීම හෝ යටත් කර ගැනීම" ගැන වූ සඳහන් කිරීමක් එවැනි වෙළෙඳ පළක බඩු හෝ සේවාවන් සපයන්නකු වශයෙන් හෝ අත්කර ගන්නකු වශයෙන් වූ වෙළෙඳ පළ පාලනය කිරීම හෝ යටත්කර ගැනීම පිළිබඳ සඳහන් කිරීමක් ලෙස තේරුම් ගත යුතු ය.

14. යම් තැනැත්තකු ස්වකීය ව්‍යාපාර ක්‍රියාවලියේ දී අනුගමනය කරන ක්‍රියාකලාපය තනිව ගත් කළ හෝ ඔහු හා සම්බන්ධ තැනැත්තන් විසින් අනුගමනය කරනු ලබන ක්‍රියා කලාපය සමග ගත් කළ, ශ්‍රී ලංකාව තුළ බඩු නිෂ්පාදනය, සැපයීම හෝ අත්කර ගැනීම හෝ ශ්‍රී ලංකාව තුළ සේවා සැපයීම හෝ ලබා ගැනීම සම්බන්ධයෙන් වූ තරඟය සීමා කිරීමේ, විකෘති කිරීමේ හෝ වැළැක්වීමේ ප්‍රතිඵලය ගෙන දෙන, ගෙන දීමට අදහස් කරන ලද හෝ ගෙන දීමට ඉඩ ඇති ක්‍රියා කලාපයක් අනුගමනය කරන අවස්ථාවක 11 වන වගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා තරඟ විරෝධී චර්යාවක් පවතින ලෙස සැලකිය යුතු ය. තරඟ විරෝධී චර්යාව.

15. (1) 11 වන වගන්තියෙහි නිශ්චිත ව සඳහන් කාරණා අතුරින් එකක් හෝ සියල්ලම සම්බන්ධයෙන් පැවැත්වූ විමර්ශනයක් නිම වූ පසු— විමර්ශනය නිමවූ පසු කොමිෂන් සභාව විසින් නියමය කළ යුතු බව.

(අ) යම් ඒකාධිකාර තත්ත්වයක් හෝ ඒකාබද්ධ කිරීමේ තත්ත්වයක් හෝ තරඟ විරෝධී චර්යාවක් පවතින නමුත් ඒ ඒකාධිකාර හෝ ඒකාබද්ධ කිරීමේ තත්ත්වය හෝ තරඟ විරෝධී චර්යාව මහජන යහපතට පටහැනිව ක්‍රියාත්මක

නොවන බව හෝ ක්‍රියාත්මක වීමට ඉඩ නැති බව නැත හොත් යෝජිත ඒකාබද්ධ කිරීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, ඒ යෝජිත ඒකාබද්ධ කිරීම මහජන යහපතට පටහැනිව ක්‍රියාත්මක වීමට ඉඩ නැති බව කොමිෂන් සභාවේ මතය වූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් නියමයක් මගින්, ඒ ඒකාධිකාර හෝ ඒකාබද්ධ කිරීමේ තත්ත්වය හෝ තරඟ විරෝධි චර්යාව හෝ යෝජිත ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් බලය දිය හැකි ය.

යම් ඒකාධිකාර හෝ ඒකාබද්ධ කිරීමේ තත්ත්වයක් හෝ තරඟ විරෝධි චර්යාවක් හෝ යෝජිත ඒකාබද්ධ කිරීමක් මහජන යහපතට පටහැනිව ක්‍රියාත්මක වන්නේ ද යන වග හෝ ක්‍රියාත්මක වීමට ඉඩ ඇත් ද යන වග මේ ඡේදයේ කාර්ය සඳහා තීරණය කිරීමේ දී කොමිෂන් සභාව විසින්, විමර්ශනයට භාජන වී ඇති කාරණයට අදාළ යයි කොමිෂන් සභාවට පෙනී යන සියලු කරුණු සලකා බැලිය යුතු අතර පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු ය:—

(i) බඩු හා සේවාවන් සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟයක් පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම;

(ii) බඩුවල සහ සේවාවල මිල සහ තත්ත්වය සම්බන්ධයෙන් ද සැපයෙන බඩුවල සහ සේවාවල විවිධත්වය සම්බන්ධයෙන් ද ඒවා පරිභෝජනය කරන්නන්ගේ, මිල දී ගන්නන්ගේ සහ පරිහරණය කරන වෙනත් අයගේ සම්බන්ධිතා ප්‍රවර්ධනය කිරීම;

(iii) තරඟකාරිත්වය මගින් පිරිවැය අඩු කිරීම, නව ශිල්පීය ක්‍රම සහ නිෂ්පාදිත වැඩිදියුණු කිරීම සහ භාවිතකිරීම ප්‍රවර්ධනය කිරීම සහ පවතින වෙළෙඳ පළවලට අළුත් තරඟකරුවන් පිවිසීමට පහසුකම් සැලසීම;

(iv) කාර්මික ක්‍රියාකාරීත්වය සහ සේවා නියුක්තිය සම තුලිතව බෙදීයාම පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම; සහ

(v) අපනයන වෙළෙඳ පළවල තරඟකාරිත්වය පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම;

(ආ) යෝජිත ඒකාබද්ධ කිරීම මහජන යහපතට පටහැනිව ක්‍රියාත්මක වීමට ඉඩ ඇති බව කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවක, ඒ යෝජිත ඒකාබද්ධ කිරීමට බලය දීම කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(ඇ) යම් ඒකාධිකාර හෝ ඒකාබද්ධ කිරීමේ තත්ත්වයක්, හෝ තරඟ විරෝධී චර්යාවක් පවතින බව සහ එය මහජන යහපතට පටහැනිව ක්‍රියාත්මක වන බව කොමිෂන් සභාවේ මතය වූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් නියමයක් මගින් පහත සඳහන් කරුණු සඳහා විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය :—

(i) යම් වෙළෙඳ ව්‍යාපාරයක් එහි ව්‍යවසායේ හෝ වත්කම් වල යම් කොටසක් විකිණීමෙන් හෝ වෙනත් ක්‍රමය කින් බෙදීම සඳහා (යම් එක් තැනැත්තකු විසින් හෝ යම් අන්තර්බද්ධ සංස්ථා දෙකක් හෝ වැඩි ගණනක් විසින් වෙළෙඳ ව්‍යාපාරයක් වශ යෙන් කරගෙන යනු ලබන සියලු කටයුතු මේ කාර්ය සඳහා තනි වෙළෙඳ ව්‍යාපාරයක් වශයෙන් සලකනු ලැබිය හැකිය), නැතහොත් යම් අන්තර් බද්ධ සංස්ථා සමූහයක් බෙදීම සඳහා සහ පහත සඳහන් කාරණා ඇතුලුව එම බෙදීම ක්‍රියාත්මක කිරීම හෝ ගණන් ගැනීම සඳහා අවශ්‍ය කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම :—

(අ) දේපළ, අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් පැවරීම හෝ සතු කිරීම ;

(ආ) යම් වගකීමකින් හෝ බැඳීමකින් නිදහස් කිරීමෙන් හෝ වගකීම හෝ බැඳීම අඩු කිරීමෙන් හෝ අන්‍යාකාරයෙන් ගිවිසුම් ගැළපීම ;

(ඇ) යම් කොටස්, ස්කන්ධ හෝ සුරැකුම් පත් ඇති කිරීම, විභජනය කිරීම, පවාරණය හෝ අවලංගු කිරීම ;

(ඈ) 1982 අංක 17 දරන සමාගම් පනතේ විධි විධානවලට යටත්ව සහ ඒවාට අනුකූලව සංස්ථාගත කළ හෝ නොකළ යම් සමා ගමක් හෝ වෙනත් සංගමයක් පිහිටුවීම හෝ ගණන් බේරා වසා දැමීම හෝ යම් සමාගමක් හෝ සංගමයක් විධිමත් කෙරෙන සංස්ථා පත්‍රය සහ ව්‍යවස්ථාවලිය හෝ වෙනත් සාධන පත්‍ර සංශෝධනය කිරීම ;

(ඉ) ස්වකීය කොටස් ප්‍රාග්ධනය, සංයුතිය හෝ වෙනත් කාරණා සම්බන්ධයෙන් සමාගමක් හෝ සංගමයක් කෙරෙහි බලපාන නියමයක විධිවිධාන සමාගම හෝ සංගමය විසින් කවර ප්‍රමාණයකට කවර අවස්ථාගත කරුණු යටතේ වෙනස් කළ හැකි ද යන වග සහ එසේ බලපානු ලැබූ සමාගම් හා සංගම් විසින් එම නියමය යම් ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කිරීම ;

(ඊ) අවශ්‍ය යම් පාර්ශ්වකරුවන් පිළිබඳ වෙනස් කිරීමක් සිදු කොට යම් නීති කෘත්‍ය දිගටම පවත්වාගෙන යාම ;

(ii) යම් ක්‍රියාකාරකමක් කරගෙන යාම හෝ යම් වත්කම් ආරක්ෂා කිරීම සඳහා නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන විධිවිධාන මත සහ එසේ සඳහන් කරනු ලබන බලතල සහිතව එය කිරීමට හෝ එය ඉටු කිරීම අධීක්ෂණය කිරීමට තැනැත්තකු පත් කිරීමෙන් හෝ වෙනත් ආකාරයකින් පියවර ගැනීම ;

(iii) නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන ආකාරයකින් යම් තරඟ විරෝධී චර්යාවක් අවසාන කිරීම ; හා

(iv) යම් ඒකාධිකාර හෝ ඒකාබද්ධ කිරීමේ තත්ත්වයකින් හෝ තරඟ විරෝධී චර්යාවකින් ඇතිවන අහිතකර ප්‍රතිඵල වැළැක්වීමේ හෝ ඊට පිළියම් යෙදීමේ කාර්ය සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව අදහස් කරන වෙනත් කටයුතු.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (i) වන අනු ඡේදයේ සඳහන් අන්දමට වෙළෙඳ ව්‍යාපාරයක් බෙදීම ගැන වූ සඳහන් කිරීම කට, අන්තර්බද්ධ සංස්ථාවල ව්‍යාපාරාංශ වීමේ හේතුව හැර, වෙනත් අයුරින් පොදු පාලනයක් යටතේ ඇති ව්‍යාපාරාංශවල ව්‍යවසායක හෝ අදාළ වත්කම්වල හෝ වෙනත් දේවල යම් කොටසක් විකිණීමෙන් වෙන් කිරීම ගැනවූ සඳහන් කිරීමක් ද ඇතුළත් වන ලෙස තේරුම් ගත යුතු ය.

15 වන වගන්තිය යටතේ වූ නියමය පළ කිරීම.

16. කොමිෂන් සභාව විසින් 15 වන වගන්තිය යටතේ කරන ලද නියමයක්, කොමිෂන් සභාව සුදුසු යයි අදහස් කරන ආකාරය කින් පළ කරවනු ලැබිය හැකි ය.

අභියාචන.

17. කොමිෂන් සභාව විසින් 15 වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ නියමය කරනු ලැබීමෙන් දින තිහක් ඇතුළත, ඊට විරුද්ධ ව අභියාචනාධිකරණය වෙත අභියාචනා කළ හැකි ය.

## IV වන කොටස

### කොමිෂන් සභාව වෙත කරනු ලබන ඉල්ලීම්, යොමුකිරීම් සහ විධාන

ඇතැම් භාණ්ඩවල මිල නියම කරන ලෙස හෝ මිල ව්‍යුහය දක්වන ලෙස මිල පාලකවරයා විසින් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිය හැකි බව.

18. නියමිත භාණ්ඩයක් නොවන භාණ්ඩයක හිඟයක් ශ්‍රී ලංකාව තුළ ඇතැයි හෝ ඇතිවීමට ඉඩ තිබේ යයි හෝ පසුව සඳහන් කළ භාණ්ඩයේ මිලෙහි අසාධාරණ වැඩිවීමක් ඇතැයි හෝ ඇති වීමට ඉඩ තිබේ යයි හෝ ඒ භාණ්ඩය විකුණනු ලබන මිල අධික යයි මිල පාලකවරයාට පෙනී යන්නේ නම්—

(අ) ඒ භාණ්ඩය විකිණීමේ දී නොඉක්මවිය යුතු උපරිම කර්මාන්ත ශාලා මිල, තොග මිල හා සිල්ලර මිල නියම කරන ලෙස හෝ ඒ උපරිම මිල නියම කිරීමේ දී අනුගමනය කළ යුතු මිල ව්‍යුහය දක්වන ලෙස ; හෝ

(ආ) යම් භාණ්ඩයක් සම්බන්ධයෙන්, එය විකිණීමේ දී නොඉක්මවිය යුතු උපරිම මිල නියම කරමින් හෝ ඒ උපරිම මිල නියම කිරීමේ දී අනුගමනය කළ යුතු මිල ව්‍යුහය දක්වමින් 20 වන වගන්තිය යටතේ කරන ලද තත් කාලයේ බලපවත්වන නියමයක් තිබෙන අවස්ථාවක ඒ නියමයෙන් නියම කරන ලද උපරිම මිල හෝ දක්වන ලද මිල ව්‍යුහය වෙනස් කරන ලෙස හෝ

ඔහු විසින් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිය හැකිය :

එසේ වුවද ඉතා හදිසි අවස්ථාවක දී එවැනි භාණ්ඩයක උපරිම මිල නියම කිරීම අවශ්‍ය යයි මිල පාලකවරයා සලකන විටෙක දී මිල පාලකවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින්, ඒ භාණ්ඩයේ උපරිම මිල නියම කිරීම ද එවිට ම කොමිෂන් සභාවෙන් යටකී පරිදි ඉල්ලීමක් කිරීම ද කරනු ලැබිය හැකි ය ; තව ද එවැනි නියමයක් එය කොමිෂන් සභාව විසින් ස්ථිර කරනු ලබන තුරු හෝ වෙනස් කරනු ලබන තුරු 20 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරනු ලැබූ නියමයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

භාණ්ඩයක් සඳහා නියම කරන ලද මිල වෙනස් කරන ලෙස අදාළ නියෝජ්‍යායතනය විසින් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිය හැකි බව.

**19.** යම් භාණ්ඩයක් විකිණීමේ දී නොඉක්මවිය යුතු උපරිම මිල නියම කරමින් හෝ ඒ උපරිම මිල නියම කිරීමේ දී අනුගමනය කළ යුතු මිල ව්‍යුහය දක්වමින් හෝ 20 වන වගන්තිය යටතේ කරන ලද තත් කාලයේ බලපවත්වන නියමයක් ඒ භාණ්ඩය සම්බන්ධයෙන් තිබෙන අවස්ථාවක, අදාල නියෝජ්‍යායතනයක් විසින්, ඒ නියමය මගින් නියම කරන ලද මිල හෝ දක්වන ලද මිල ව්‍යුහය වෙනස් කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

18 වන වගන්තිය හෝ 19 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට කොමිෂන් සභාවේ පරිපාටිය හා බලතල.

**20.** (1) 18 වන වගන්තිය හෝ 19 වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක් කොමිෂන් සභාවට ලැබුණු විට, ඒ ඉල්ලීම කොමිෂන් සභාවට ලැබුණු බවට සහ ඒ ඉල්ලීම පිළිබඳ තම අදහස් සහ විවේචන කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස ඒ ඉල්ලීම පිළිබඳ සම්බන්ධතාවක් දක්වන තැනැත්තන්ගෙන් ඉල්ලා සිටින බවට දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කිරීමට කොමිෂන් සභාව විසින් සැලැස්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් අදහස් සහ විවේචන කොමිෂන් සභාව විසින් නිර්ණය කරනු ලබන ආකාරයකින් සහ එසේ නිර්ණය කරනු ලබන කාලසීමාව ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඉහත සඳහන් වගන්ති දෙකෙන් කවරක් හෝ යටතේ කරන ලද ඉල්ලීමක් විභාග කරනු ලැබීමෙන් පසුව සහ ඒ ඉල්ලීම සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ හෝ මිල පාලකවරයා විසින්

හෝ ඉදිරිපත් කරන ලද අදහස් සහ විවේචන ඇතොත් ඒවා සලකා බලනු ලැබීමෙන් පසුව, ඒ ඉල්ලීම සාධාරණ යයි කොමිෂන් සභාව සෑහීමට පත් වුවහොත්, කොමිෂන් සභාව විසින්—

(අ) 18 (අ) වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ විට, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, එම ඉල්ලීමෙහි සඳහන් භාණ්ඩය විකිණීමේ දී නොඉක්මවිය යුතු උපරිම කර්මාන්ත ශාලා මිල හෝ තොග මිල හෝ සිල්ලර මිල නියම කිරීම හෝ ඒ උපරිම මිල නියම කිරීමේ දී අනුගමනය කළ යුතු මිල ව්‍යුහය දැක්වීම ; සහ

(ආ) 18 (ආ) වන වගන්තිය හෝ 19 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ විට, ඒ ඉල්ලීමෙහි සඳහන් භාණ්ඩය විකිණීමේ දී නොඉක්මවිය යුතු උපරිම කර්මාන්ත ශාලා මිල හෝ තොග මිල හෝ සිල්ලර මිල නියම කරමින් හෝ ඒ උපරිම මිල නියම කිරීමේදී අනුගමනය කළ යුතු මිල ව්‍යුහය දක්වමින් හෝ කරන ලද නියමය වෙනස් කිරීම

කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක්ම ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

(5) (3) වන උපවගන්තිය යටතේ වූ නියමයකින් එහි සඳහන් භාණ්ඩය විකිණීම කරනු ලබන වේලාව සහ ස්ථානය ද, විකුණනු ලබන භාණ්ඩ ප්‍රමාණය සහ එහි තත්ත්වය ද පිළිබඳ කොන්දේසි ඇතුළුව, ඒ භාණ්ඩය විකිණීම පිළිබඳ කොන්දේසි නියම කරනු ලැබිය හැකි ය.

(6) 18 වන වගන්තිය හෝ 19 වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක්, අවස්ථාවෝචිත පරිදි, භාණ්ඩයක සිල්ලර මිල හෝ තොග මිල හෝ කර්මාන්ත ශාලා මිල හෝ සම්බන්ධයෙන් පමණක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ භාණ්ඩය විකිණීමේදී නො ඉක්මවිය යුතු, අවස්ථාවෝචිත පරිදි, උපරිම සිල්ලර මිල හෝ තොග මිල හෝ කර්මාන්ත ශාලා මිල (3) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් නියම කරනු ලබන විට, කොමිෂන් සභාව විසින් ඒ නියමය මගින් ම අවස්ථාවෝචිත පරිදි, ඒ භාණ්ඩය විකිණීමේ දී නොඉක්මවිය යුතු උපරිම තොග මිල සහ කර්මාන්ත ශාලා මිල හෝ උපරිම සිල්ලර මිල සහ කර්මාන්ත ශාලා මිල හෝ උපරිම සිල්ලර මිල සහ තොග මිල ද නියම කරනු ලැබිය හැකි ය.

20 වන වගන්තිය යටතේ වූ බලතල හා කාර්ය ක්‍රියාත්මක කළ යුත්තේ සහ ඉටු කළ යුත්තේ කවර කාලයක් ඇතුළතද යන වග

**21.** 18 වන වගන්තිය හෝ 19 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් 20 වන වගන්තියෙන් කොමිෂන් සභාව වෙත පිරිනැමෙන බලතල ක්‍රියාත්මක කිරීම ද, නියම කෙරෙන කාර්ය ඉටු කිරීම ද ඒ ඉල්ලීම ලැබුණු දින සිට මාස දෙකක කාලය ඇතුළත කරනු ලැබිය යුතුය :

එසේ වුව ද කොමිෂන් සභාව විසින්, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් ඒ බලතල ක්‍රියාත්මක කළ යුතු සහ ඒ කාර්ය ඉටු කළ යුතු කාලය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් කලින් කල දීර්ඝ කරනු ලැබිය හැකි ය.

20 වන වගන්තිය යටතේ කළ නියමයක් පරිච්ඡින්න කිරීමට හෝ වෙනස් කිරීමට අමාත්‍ය වරයා සතු බලය.

22. (1) කොමිෂන් සභාව විසින් 20 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් අමාත්‍යවරයා විසින් පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් යම් නියමයක් පරිච්ඡින්න කරන ලද හෝ වෙනස් කරන ලද අවස්ථාවක, ඒ පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දින සිට 20 වන වගන්තිය යටතේ කරන ලද නියමය, අවස්ථාවෝචිත පරිදි, පරිච්ඡින්න කරනු ලැබූ හෝ වෙනස් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් ඒ යටතේ කරන ලද හෝ විඳින ලද යම් දෙයකට හෝ ඒ යටතේ අත්කරගන්නා ලද, උපචය වූ හෝ දරන ලද යම් අයිතියකට, බැඳීමකට හෝ වගකීමකට හානියක් නොවිය යුතු ය.

නියමිත භාණ්ඩයක මිල හෝ නියමිත සේවයක් සඳහා වූ ගාස්තුව වෙනස් කෙරෙන අවස්ථාවල අනිවාර්ය යොමු කිරීම.

23. (1) නියමිත භාණ්ඩයක මිල හෝ නියමිත සේවාවක් සඳහා වූ ගාස්තුව වෙනස් කිරීමට යෝජනා කරන අදාළ නියෝජ්‍යායතනයක් විසින් ස්වකීය යෝජනාව සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත දැන්විය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, ඒ මිල හෝ ගාස්තුව සම්බන්ධයෙන් යෝජිත වෙනස් කිරීමේ ප්‍රශ්නය විභාග කිරීම කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු ය. තවද, ඒ අනුව, කොමිෂන් සභාව විසින්, ඒ ප්‍රශ්නය විභාග කර, ඒ යොමු කිරීම කරන අදාළ නියෝජ්‍යායතනය වෙත ඒ යොමු කිරීමෙහි සඳහන් කාල සීමාව ඇතුළත ඒ ගැන වාර්තා කළ යුතු ය :

එසේ වුව ද, ඒ අදාළ නියෝජ්‍යායතනය රාජ්‍ය සංස්ථාවක සභාපතිවරයකු හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක ප්‍රධානයකු හෝ 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ වෙළෙඳ ව්‍යාපාරයක නියම බලධරයා හෝ නොවන තැනැත්තකු වෙතොත්, මේ වගන්තිය යටතේ වූ යම් යොමු කිරීමක් අමාත්‍යවරයකු මඟින් පමණක් කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින්, එසේ යොමු කරන ලද ප්‍රශ්නය විභාග කර ඒ අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතු ය.

(2) අදාළ නියෝජ්‍යායතනය විසින් යම් නියමිත භාණ්ඩයක මිල හෝ යම් නියමිත සේවාවක් සඳහා වූ ගාස්තුව වෙනස් කිරීම, අවස්ථාවෝචිත පරිදි, ඒ මිල හෝ ගාස්තුව වෙනස් කිරීමේ ප්‍රශ්නය පිළිබඳව කොමිෂන් සභාව විසින් විභාග කොට වාර්තා කරනු ලැබීමෙන් පසුව මිස, නොකරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, අදාළ නියෝජ්‍යායතනය රාජ්‍ය සංස්ථාවක සභාපතිවරයකු හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක ප්‍රධානයකු හෝ 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව වෙත සතු කරන ලද වෙළෙඳ ව්‍යාපාරයක නියම බලධරයකු වෙතොත්, ඒ නියෝජ්‍යායතනය විසින්, ඒ නියමිත භාණ්ඩයේ මිල හෝ නියමිත සේවාවේ ගාස්තුව වැඩි කිරීම අවශ්‍ය යයි සලකනු

ලබන්නා වූ ඉතා හදිසි අවස්ථාවක (1) වන උපවගන්තිය යටතේ ඒ නියෝජ්‍යායතනය විසින් කරන ලද යොමු කිරීමක් පිළිබඳව කොමිෂන් සභාවෙන් වාර්තාවක් ලැබීමට තිබිය දී, ඒ මිල හෝ ඒ ගාස්තුව වැඩි කරනු ලැබිය හැකි ය.

උපදෙස් සඳහා යොමු කිරීම.

24. යම් අමාත්‍යවරයකු විසින් සිය මෙහෙයීමෙන් ම හෝ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් තමා වෙත කරන ලද කරුණු දැක්වීමක් මත හෝ යම් භාණ්ඩයක මිල හෝ යම් සේවාවක් සඳහා වූ ගාස්තුව පිළිබඳ වූ යම් ප්‍රශ්නයක් විභාග කර වාර්තා කිරීම සඳහා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි අතර, ඒ අනුව, කොමිෂන් සභාව විසින් ඒ ප්‍රශ්නය විභාග කර, ඒ යොමු කිරීම කළ අමාත්‍යවරයා වෙත, ඒ යොමු කිරීමෙහි දැක්වෙන කාලය ඇතුළත, ස්වකීය වාර්තාව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව විසින් භාණ්ඩ මිල යනාදිය පිළිබඳ ප්‍රශ්න සමාලෝචනය කිරීම.

25. කොමිෂන් සභාව විසින්, සිය මෙහෙයීමෙන් ම හෝ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් කොමිෂන් සභාව වෙත කරන ලද කරුණු දැක්වීමක් මත හෝ යම් භාණ්ඩයක මිල හෝ යම් සේවාවක් සඳහා වූ ගාස්තුව පිළිබඳ යම් ප්‍රශ්නයක් සමාලෝචනය කොට, යුක්ති සහගත යයි කොමිෂන් සභාව සලකන කාලයක් ඇතුළත අමාත්‍යවරයා වෙත වාර්තා කරනු ලැබිය හැකිය.

මේ පනත යටතේ කරන ලද වාර්තාවක් පළ කිරීම.

26. මේ පනතේ විධිවිධාන යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක් හෝ ඒ වාර්තාවෙන් කරන ලද නිර්දේශ කිසිවක් සුදුසු යයි තමා සිතන ආකාරයකින් අමාත්‍යවරයා විසින් පළ කරවනු ලැබිය හැකි ය.

## V වන කොටස

### කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ මහා ලේකම්වරයා.

27. (1) ("මහා ලේකම්වරයා" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ මහා ලේකම්වරයකු කොමිෂන් සභාව විසින්, අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව, පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද මහා ලේකම්වරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. තව ද ඔහු සියලු අවස්ථාවල දී කොමිෂන් සභාවේ විධානය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) අමාත්‍යවරයාගේ අදහස් විමසීමෙන් පසු කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් මහා ලේකම්වරයාට ගෙවිය යුතු ය.

(4) රෝගාතුරව සිටීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්ය ඉටු කිරීමට මහා ලේකම්වරයාට නොහැකි වන කවර වූ හෝ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව, මහා ලේකම්වරයා නොපැමිණ සිටින කාලය තුළ ඔහු වෙනුවෙන් වැඩ බැලීමට සුදුසු යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ නිලධරයන්, සේවකයන් සහ උපදේශකවරයන් පත් කිරීම.

28. (1) කොමිෂන් සභාවේ වැඩ කටයුතු කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන්, සේවකයන් සහ උපදේශකවරයන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන නිලධරයන්ට, සේවකයන්ට සහ උපදේශකවරයන්ට අමාත්‍යවරයා විමසා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණ මත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම

29. (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන කාලයක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිර ව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹුනු යම් තැනැත්තකු කොමිෂන් සභාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාවට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට සේවය කරනු ලබන කාලයක් වශයෙන් සැලකිය යුතු ය.

## VI වන කොටස

### කොමිෂන් සභාවේ අරමුදල

කොමිෂන් සභාවේ අරමුදල.

30. (1) කොමිෂන් සභාවට ඊට අයත් අරමුදලක් තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ අරමුදලට—

(අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ; සහ

(ආ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා කොමිෂන් සභාවට ලැබෙන සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික සහ මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමෙහි ලා කොමිෂන් සභාව විසින් දරන ලද වියදම් පියවීම පිණිස අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන් ද මේ පනතින් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ගෙවනු ලැබීමට නියමිත සියලු මුදල් ප්‍රමාණයන් ද කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

31. (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේ ය.

(2) කොමිෂන් සභාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් හා වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යාමට සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ ඇති විධිවිධාන කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

## VII වන කොටස

### විවිධ කරුණු

ඇතැම් ව්‍යවසායන් සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාල නොවිය යුතු බව.

32. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාව සමග යම් ගිවිසුමකට එළඹ ඇති යම් ව්‍යවසායකට හෝ ව්‍යවසායක් සම්බන්ධයෙන් හෝ මේ පනතේ කිසිවක් අදාළ නොවිය යුතු ය.

11 වන වගන්තිය යටතේ වූ පැමිණිලි සහ 18 වන සහ 19 වන වගන්ති යටතේ වූ ඉල්ලීම් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකෘතිය අනුව තිබිය යුතු බව.

33. 11 වන වගන්තිය යටතේ කරනු ලබන සෑම පැමිණිල්ලක් සහ 18 වන වගන්තිය හෝ 19 වන වගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක්ම, කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා තීරණය කරනු ලබන ආකෘතිය අනුව විය යුතු ය.

මේ පනත යටතේ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

34. (අ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට විරුද්ධ ව ; හෝ

(ආ) මේ පනත යටතේ කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ උපදේශකවරයකු විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

35. කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන්, නිලධරයන්, සේවකයන් සහ උපදේශකවරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

36. කොමිෂන් සභාව, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

37. (1) (අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ මේ පනත යටතේ නීත්‍යානුකූලව දෙන ලද යම් විධානයක් හෝ නීත්‍යානුකූලව කරන ලද යම් නියමයක් කඩ කරන හෝ පිළිපැදීම පැහැර හරින ; හෝ

වැරදි සහ දණ්ඩන.

(ආ) (i) 7 වන වගන්තිය යටතේ වාර වාර්තාවක් සපයන ලෙස කොමිෂන් සභාව විසින් නියම කරන ලද විට එසේ කිරීම ; හෝ

(ii) 8 වන වගන්තිය යටතේ යවනු ලබන දැන්වීමක් මගින් යම් තොරතුරක් සපයන ලෙස හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කරන ලද විට එසේ කිරීම නොකර හරින හෝ ප්‍රතික්ෂේප කරන ; හෝ

(ඇ) මේ පනත යටතේ සපයන යම් වාර වාර්තාවක දැනුවත්ව යම් අසත්‍ය ප්‍රකාශයක් කරන, හෝ, යම් තොරතුරක් සපයන ලෙස කොමිෂන් සභාව විසින් නියම කරන ලද විට දැනුවත්ව යම් අසත්‍ය තොරතුරක් සපයන ; හෝ

(ඈ) 9 වන වගන්තිය යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා කටයුතු කරන යම් නිලධරයකුට බාධා කරන

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

(2) (අ) 15 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් අනුව කටයුතු කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ ඒ නියමය කඩ කරන හෝ යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්

වෙන තවු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය ;

(ආ) 15 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ කරන ලද නියමයක් හැර, ඒ වගන්තිය යටතේ වූ නියමයක් කරනු ලැබුවේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද අධිකරණය විසින් තීරණය කරනු ලබන යම් කාලයක් හෝ 15 වන වගන්තිය යටතේ කරන ලද නියමය අනුව ඒ තැනැත්තා කටයුතු කරන තෙක් හෝ ඒ ව්‍යාපාරය කර ගෙන යාමෙන් වළකින ලෙස ඒ තැනැත්තාට අධිකරණය විසින් ඊට අතිරේකව ආඥා කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ වරදකරුවන් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් කොමිෂන් සභාව සුදුසු යයි සලකන ආකාරයකින් කොමිෂන් සභාව විසින් පළ කරනු ලැබිය හැකි ය ; නැතහොත් පළ කිරීමට සැලැස්විය හැකි ය.

(4) මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන අවස්ථාවක,—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු සහ නිලධරයකු ; සහ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම,

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය ;

එසේ වුවද, ඒ වරද කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැතිව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට තමා නිසි සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ හවුල් කරු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු වන්නේ යයි නොසැලකිය යුතු ය.

(5) නීතිපතිවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව මිස, මේ පනත යටතේ යම් වරදක් සඳහා කිසිම නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

නියෝග.

38. (1) නියම කිරීමට මේ පනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දෙනු ලැබූ කාරණා සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන්ම සහ (1) වන උපවගන්තියෙන් පිරිනැමෙන බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින්

පහත සඳහන් සියලු කාරණා හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) මේ පනතේ කාර්ය සඳහා භාණ්ඩ සහ සේවාවන් නියම කිරීම ;

(ආ) කොමිෂන් සභාවේ රැස්වීම් කැඳවිය යුතු ආකාරය නියම කිරීම ;

(ඇ) කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත්විය යුතු ආකාරය නියම කිරීම ;

(ඈ) කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන පරීක්ෂණවලට සහ විමර්ශනවලට පෙනී සිටින ලෙස කැඳවනු ලබන සාක්ෂිකරුවන්ගේ වියදම් ගෙවිය යුත්තේ කවුරුන් විසින් සහ කවර ආකාරයකින් ද යන්න නියම කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එය පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයෙහි සඳහන් යම් පසු දිනෙක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතියේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

39. (1) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනත මෙයින් ඉවත් කරනු ලැබේ. ඉවත් කිරීම සහ ඉතිරි කිරීම්.

(2) ඉහත කී පනත ඉවත් කරනු ලැබුව ද—

(අ) ඉවත් කරනු ලැබූ පනතේ 25 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවේ අරමුදලේ බැරට නියමිත දිනයට ඉහතින් වූ දිනයේ දී ඇති සියලු මුදල්, මේ පනත යටතේ පිහිටුවනු ලබන කොමිෂන් සභාවේ අරමුදලට පවරනු ලැබිය යුතු ය ;

(ආ) නියමිත දිනයට ඉහතින් වූ දිනයෙහි ජාතික මිල කොමිෂන් සභාව ඉදිරියෙහි පවත්නා සියලු පරීක්ෂණ සහ විභාග මේ පනතේ විධිවිධාන යටතේ කොමිෂන් සභාව ඉදිරියෙහි අවසන් නොවී පවත්නා පරීක්ෂණ සහ විභාග ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන යටතේ ඒ කොමිෂන් සභාව ඉදිරියෙහි නොකඩවා කටයුතු කොට අවසන් කරනු ලැබිය යුතු ය ;

(ඇ) ඉවත් කරනු ලැබූ පනතේ 17 වන වගන්තිය සහ 18 වන වගන්තිය යටතේ කරන ලද සියලු ඉල්ලීම් සහ 23 වන වගන්තිය, 24 වන වගන්තිය සහ 25 වන වගන්තිය යටතේ විභාග කිරීම සඳහා යොමු කරන ලදුව නියමිත

දිනයට ඉහතින් වූ දිනයෙහි ජාතික මිල කොමිෂන් සභාව ඉදිරියෙහි අවසන් නොවී පැවැති සියලු ප්‍රශ්න, මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත කරන ලද ඉල්ලීම් සහ යොමු කරන ලද ප්‍රශ්න ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද ඒ අනුව, මේ පනතේ විධිවිධාන යටතේ කොමිෂන් සභාව විසින් පරීක්ෂා කිරීම හා විභාග කිරීම කළ යුතු ය;

(ඈ) ඉවත් කරනු ලැබූ පනතේ විධිවිධාන යටතේ ජාතික මිල කොමිෂන් සභාව විසින් කරන ලද සියලු නියමයන් සහ ඉදිරිපත් කරන ලද සියලු වාර්තා මේ පනතේ විධි විධාන යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද නියම යන් හෝ ඉදිරිපත් කරන ලද වාර්තා ලෙස සැලකිය යුතු ය;

(ඉ) ජාතික මිල කොමිෂන් සභාව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරනු ලැබ යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක නියමිත දිනයට ඉහතින් වූ දිනයෙහි විනිශ්චයට භාජනව ඇති සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතු කොමිෂන් සභාව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලද සිවිල් හෝ අපරාධ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඊ) ජාතික මිල කොමිෂන් සභාවේ වාසියට හෝ ඊට විරුද්ධව යම් අධිකරණයක් විසින් සටහන් කරන ලද හෝ කරන ලද සියලු තීන්දු ප්‍රකාශ සහ ආඥා, කොමිෂන් සභාවේ වාසියට හෝ ඊට විරුද්ධව සටහන් කරන ලද හෝ කරන ලද තීන්දු ප්‍රකාශ සහ ආඥා ලෙස සලකනු ලැබිය යුතු වන අතර ඒ අනුව බලාත්මක කරනු ලැබිය හැකි ය;

(උ) ඉවත් කරන ලද පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ නියමිත දිනයෙහි බලාත්මකව ඇත්තා වූ ද, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද සෑම නියෝගයක් ම මේ පනත යටතේ සාදන ලද නියෝග යක් ලෙස සලකනු ලැබිය යුතු වන අතර ඒ අනුව, මේ පනත යටතේ සාදන ලද නියෝග මඟින්, එය සංශෝ ධනය කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය;

(ඌ) ජාතික මිල කොමිෂන් සභාවේ සියලු නිලධරයන්, සේවක යන් සහ උපදේශකවරයන් නියමිත දින සිට කොමිෂන් සභාවේ නිලධරයන්, සේවකයන් සහ උපදේශකවරයන් ලෙස සලකනු ලැබිය යුතු වන අතර, ජාතික මිල කොමිෂන් සභාවේ ඔවුන්ගේ සේවානියුක්තියට අදාළ නියමයන්ට සහ කොන්දේසිවලට අඩුවෙන් වාසිදායක නොවන නියම යන්ට සහ කොන්දේසිවලට යටත් ව තම ධුර දැරිය යුතු ය;

(එ) ජාතික මිල කොමිෂන් සභාව විසින් ඇති කරගත් සියලු ණය, බැඳීම් සහ බැරකම් ද ලියා අත්සන් කරන ලද හෝ ඇතුළත් වූ සියලු ගිවිසුම් සහ එකඟවීම් ද ජාතික මිල කොමිෂන් සභාව විසින් හෝ සමඟ හෝ වෙනුවෙන් හෝ

කිරීමට භාර ගනු ලැබූ සියලු කාරණා සහ දේවල් ද කොමිෂන් සභාව විසින් ඇති කර ගත් හෝ ලියා අත්සන් කරන ලද හෝ ඇතුළත්වූ හෝ භාර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

40. 1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම.

(1) ඒ පනතේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ජාතික මිල කොමිෂන් සභාව" යන වචන වෙනුවට "සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ පනතේ 21 වන වගන්තියේ (6) වන උපවගන්තියේ "ජාතික මිල කොමිෂන් සභාව" යන වචන වෙනුවට "සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ පනතේ 23 වන වගන්තිය ඉවත් කිරීමෙන්.

41. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපනය.

"භාණ්ඩය" යන්නෙන් යම් ආහාරයක්, පානයක් හෝ වෙළෙඳ භාණ්ඩයක් අදහස් වේ ;

"සභාපති" යන්නෙන් කොමිෂන් සභාවේ සභාපති වශයෙන් හෝ සභාපති වශයෙන් ක්‍රියා කිරීමට හෝ මේ පනත යටතේ පත් කරන ලද තැනැත්තා අදහස් වේ ;

"මිල පාලකවරයා" යන්නෙන් මිල පාලන පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද මිල පාලකවරයා අදහස් වේ ;

"අදාළ නියෝජ්‍යායතනය" යන්නෙන්—

(අ) යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් වන විට ඒ භාණ්ඩයේ නිෂ්පාදක, ආනයනකරු හෝ එය බෙදා හරින්නා හෝ ඒ භාණ්ඩයේ මිල නියම කිරීම පිළිබඳව වගකිව යුතු වෙනත් යම් තැනැත්තෙක් අදහස් වේ ; තව ද

(ආ) නියමිත සේවාවක් සම්බන්ධයෙන් වන විට, ඒ සේවාව සලසන රාජ්‍ය සංස්ථාවක සභාපතිවරයා හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක ප්‍රධානයා හෝ වෙනත් යම් තැනැත්තෙක් අදහස් වේ.

උපලේඛනය (4 (3) වන වගන්තිය)

කොමිෂන් සභාවේ සාමාජිකයන්ට අදාළ විධිවිධාන

1. යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, යම් සංවර්ධන සභාවක සභිකයෙක් හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයෙක් වශයෙන් සිටී නම් හෝ වන්නේ නම් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නොවන්නේ නම්, හෝ තමා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වන්නේ නම්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ තමා සිහිවිකල තැනැත්තෙකු යයි තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද දණ්ඩන නියමයක් මත බන්ධනාගාරගතව සිටී නම් හෝ බන්ධනාගාරගතව සිට තිබේ නම්

කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමට හෝ ඔහු සුදුසු නොවන්නේ ය.

2. මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය හිස් කරනු ලැබුවහොත් මිස, කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙකු ම, ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය. තව ද ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය:

එසේ වුව ද මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ධුරය හිස් කළ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ සාමාජිකයකු තමා අනුප්‍රාප්තිකයා වූයේ යම් සාමාජිකයකුට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

3. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හේතු නොදක්වා ඉවත් කරනු ලැබිය හැකි ය. මේ ඡේදය යටතේ නියමයක් කරනු ලබන්නේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට ඒ සාමාජිකයා විසින් තම ධුරය හිස් කරනු ලබන ලෙස සැලකිය යුතු ය.

(2) (1) වන අනුඡේදය යටතේ යම් සාමාජිකයකු ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

4. අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට කවර වූ හෝ අවස්ථාවක දී තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් ඒ ඉල්ලා අස්වීම පිළිගනු ලැබූ විට එය ක්‍රියාත්මක වන්නේ ය.

5. මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුගේ ධුරය හිස් කරනු ලැබුවහොත්, 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිල්ල ඇතිව අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

6. කොමිෂන් සභාවේ සාමාජිකයකු රෝගාතුරවීම, අබලතාවට පත් වීම හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම කාර්ය ඉටු කිරීම තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ නොහැකි වීම සම්බන්ධයෙන් ලියවිල්ලකින් අමාත්‍යවරයා වෙත දැනුම් දීම ඒ සාමාජිකයාගේ කාර්යය වන්නේ ය. එවිට අමාත්‍යවරයා විසින්, 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිල්ල ඇතිව, ඒ කාලය තුළ ඒ සාමාජිකයා වෙනුවෙන් වැඩ බැලීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

7. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් කොමිෂන් සභාවේ අරමුදලින් කොමිෂන් සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

8. (1) කොමිෂන් සභාවේ සභාපතිවරයා තමා පැමිණ සිටියහොත් කොමිෂන් සභාවේ සෑම රැස්වීමක දී ම මූලාසනය දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීමෙදී මූලාසනය ගැනීමට, පැමිණ සිටින සාමාජිකයන්ගෙන් එක් අයකු තෝරා පත් කරගත යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(3) සභාපතිවරයාට හෝ ඔහු නොපැමිණි විටක, කොමිෂන් සභාවේ යම් රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට, තම ඡන්දයට අතිරේක ව තීරක ඡන්දයක් ද ඇත්තේ ය.

(4) මේ ඡේදයේ සහ 37 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය කොමිෂන් සභාව විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

9. කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම නිසාම කොමිෂන් සභාවේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් නිර්බල වන්නේ යයි නො සැලකිය යුතු ය.

10. (1) කොමිෂන් සභාවේ මුද්‍රාව සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව තැබීම, සභාපතිවරයාගේ අත්සනින් හෝ ඒ මුද්‍රාව තැබීම සහතික කිරීමට බලය දෙන ලද කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකුගේ අත්සනින් හෝ, සහතික කරනු ලැබිය යුතු ය.

11. කොමිෂන් සභාවේ යම් කටයුත්තකට විෂය වන යම් කාරණයක් හෝ කොමිෂන් සභාව විසින් කිරීමට යෝජනා කරනු ලබන යම් තීරණයක් කෙරෙහි කෙලින් ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධතාවක් දක්වන කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් ඔහුගේ සම්බන්ධතාවේ ස්වභාවය කොමිෂන් සභාවේ රැස්වීමක දී අනාවරණය කළ යුතු අතර, ඒ කාරණය පිළිබඳ වූ යම් කටයුත්තකට හෝ තීරණයකට ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

12. (1) රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ තම ධුරයේ කාර්ය ඉටු කිරීමට සභාපතිවරයාට තාවකාලිකව නොහැකි වෙතොත්, ඔහු වෙනුවෙන් වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කවර හෝ හේතුවක් නොදක්වා සභාපතිවරයාගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා වෙත යොමු කර යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට කවර වූ හෝ අවස්ථාවක දී සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් ඒ ඉල්ලා අස්වීම පිළිගනු ලැබූ විට එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) සභාපතිවරයාගේ ධුර කාලය (2) වන සහ (3) වන අනුඡේදවල විධිවිධානවලට යටත් ව කොමිෂන් සභාවේ ඔහුගේ සාමාජිකත්වය පවත්නා කාලය වන්නේ ය.